**පොල්පිතිගමප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020අප්‍රේල් 22දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව2020 ජූලි 17දින දවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 17 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කරන ලද ස්ථාවර තැන්පත් ගිණුම් දෙකක රු.165,818 ක් හා රු.925,257 ක් වූ පොලී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් කාලපරිච්ඡේදයට අදාළ පොලී ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | මහජන බැංකුවේ ශේෂ සහතිකයක් 2019 දෙසැම්බර් 31 දිනට ලබාගැනීමෙන් පසු 2020 වර්ෂයතුළදී පොලී ගිණුම්ගත කරමි. |
| (ආ) | පුස්තකාල 06 කට පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.90,294 ක පොත් ගිණුම්ගත කර නොතිබුණි. | පරිත්‍යාග වශයෙන් ලැබෙන වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී ජ්නල් සටහන් මඟින් අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.146,118,659 ක් වටිනා ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථාවර තැන්පත් සහතිකය අස්ථානගතවී ඇත.අත්තිකාරම් පිළිබඳ කිසිදු තොරතුරක් අනාවරණය කර ගැනීමට ලේඛන නොමැත.ණයගැති හා ණයහිමි ශේෂ සඳහා ශේෂ සහතික 2020 වර්ෂයේදී ඉදිරිපත් කරමි. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,656,231 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,115,048 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

--------------------

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

---------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. වරිපනම් හා බදු | 3,120,000 | 2,544,857 | 2,544,857 | - | 1,975,000 | 1,975,000 | 2,356,720 | 2,342 |
| II. බදු කුලී | 7,637,420 | 1,288,826 | 1,258,644 | 40,850 | 7,685,600 | 7,685,600 | 7,483,346 | 10,668 |
| II. බලපත්‍ර ගාස්තු | 1,150,100 | 946,202 | 946,202 | - | 850,100 | 850,100 | 1,066,613 | - |
| V. වෙනත් ආදායම් | 775,000 | 9,530,376 | 9,530,376 | - | 10,175,000 | 10,175,000 | 363,583 | - |
| එකතුව | 12,682,520 | 14,310,261 | 14,280,079 | 40,850 | 20,685,700 | 20,685,700 | 11,270,262 | 13,010 |

සටහන - 2019 වර්ෂයේ රැස් කළ ආදායම තුළ වෙනත් වර්ෂවලට අදාලව අයවීම රු.19,640,469 ක් විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්යය සාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

අතුරු ව්‍යවස්ථා

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කරුණු 12 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර ඉදිරිපත් කිරීම කඩිනම් කළ යුතුවේ. | තවදුරටත් අත්‍යවශ්‍ය අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කරමින් සිටිමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත 1999 වර්ෂයේ වාර්ෂිකව සියයට 2.5 ක පොලියක් මත ශ්‍රී ලංකා පළාත් පාලන සේවක මහා සංගමයේ තැන්පත් කර තිබූ රු.50,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තැන්පත් මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එවැනි ආයතනයක් නොමැති බවට වාර්තා වී ඇති බැවින් 2020 මාර්තු 12 දිනැති මහ සභා තීරණය අනුව පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කර අදාල ආයතනයෙන් මුදල පියවා ගැනීමට තීරණය කර ඇති බවත් 2020 මැයි 29 වන දින පොපි/ප්‍රාස/02/02/07 අංක දරණ ලිපියෙන් පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කර ඇති බවත් දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වර්ෂය අවසානයට වසර 01 කට වැඩි කාලයක් ඉක්මවා ඇති රු.2,899,560 ක් වූ ලැබිය යුතු මුදල් වලින් 2020 ජූනි 31 දින වන විට තවදුරටත් අය විය යුතු ශේෂය රු.107,164,703 ක් විය. | ලැබිය යුතු ගිණුම් ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ හිටි මුද්දර ගාස්තු රු.3,523,323 ක මුදල ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් ඉල්ලීම් කර ඇති මුත් මේ වන තෙක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කර නොමැති බවත්, රු.4,367,797 ක් වූ කර්මාන්ත ණයගැතියන්ගෙන් රු.2,463,077 ක මුදලක් අයකරගත් බවත් ඉතිරි රු.1,904,719 ක මුදල ඉදිරියේදී අයකරන බවත් දන්වමි. |
| (ඇ) | වර්ෂය අවසානයට පැවති රු.90,123,203 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂවලින් රු.88,209,931 ක් තවදුරටත් ගෙවීමට තිබුණි. | ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | වසර 05 කට වඩා වැඩි කාලයක් නිරවුල් නොකර පැවති ණයහිමි ශේෂ එකතුව රු. 5,304,622 ක් වන අතර, 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්තවලට අදාල ගොනුවල අඩුපාඩු නිසා මේ වන තෙක් ගෙවීම් නොකළ අතර ඒවා නිරවුල් වූ වහාම ඉදිරියේ දී ගෙවීම් කිරීමට කටයුතු කරන බවත්, වසර 01 ට වැඩි 03 ට අඩු ණය ශේෂ එකතුව රු. 3,252,902 ක් වන අතර මේ වන විට ශේෂය රු. 1,667,965 ක් වේ. ඉදිරියේ දී ඉතිරිය ද ගෙවීම් කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව අනුමත කළ දුරකථන කුළුණු 12 ක් සඳහා රු.71,500 ක ගාස්තු අය කර අනුකූලතා සහතික ලබා දී නොතිබුණි. සැලසුම් අනුමත කර වසරක කාලයක් ඉක්මවූ කුළුණු 06 ක් අනුකූලතා සහතික නොමැතිව භාවිතා කර තිබූ අතර ඒ සඳහා දිනකට රු.50 බැගින් අයකළ යුතු දඩ මුදල 2019 දෙසැම්බර් 31 දිනට රු.1,253,650 ක් විය. | නියමිත ගාස්තු අයකර අනුකූලතා සහතික ලබා දීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම් සැලසුම් 02 ක් 2019 මාර්තු 26 දින හා 2019 අප්‍රේල් 24 දින අනුමත කර වසරක කාලයක් ඉදිකිරීම් සඳහා අවසර ලබා දී ඇත. නමුත් ඉදිකිරීම් කාලය අවසන් නොවූ බැවින් එම කාලය දීර්ඝ කර දෙන ලෙස ඉල්ලා ඇති අතර ඉදිකිරීම් කාලය තවදුරටත් වසරකින් දීර්ඝ කර ඇති බවත් ඉදිකිරීම් අවසන් කළ පසු අනුකූලතා සහතික නිදහස් කර, ව්‍යාපාර බද්ද අයකර ගැනීමට පියවර ගන්නා බවත් දන්වමි. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තෘතීයික තනතුරක, ද්විතීක තනතුරු 04 ක් හා ප්‍රාථමික තනතුරු10 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | තෘතීයික හා ද්විතීක තනතුරු සඳහා බඳවා ගැනීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සිදු කර ආයතනය වෙත අනුයුක්ත කරනු ලබන බවත්, ප්‍රාථමික තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කඩඉම් හරහා අනුමැතිය ලබා ගෙන ගැසට් පත්‍රයේ පල කර අයදුම්පත් කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා දින යොදා තිබුණ ද මුදල් අමාත්‍යාංශය මඟින් නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවන ලදි. |

## 3.5 වත්කම් කළමනාකරණය

**පවරා නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභා බල ප්‍රදේශයේ සුසාන භූමි 128 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම සුසාන භූමි 128 ම පවරා ගැනීමට ප්‍රාදෙශීය ලේකම් වෙත ඉල්ලීම් කළ ද පවරා දීමට කටයුතු කර නොමැති බව දන්වමි. |
| (ආ) | රු.16,189,440 ක් වූ වාහන 10 ක අයිතිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | රථ වාහන 10 ක අයිතිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර ඇති බව දන්වමි. |

## 3.6 ප්‍රසම්පාදනය

----------------

### 3.6.1 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------------------------- | --------------------- | ------------------------------- |
| (අ) | ඇස්තමේන්තු වටිනාකම රු.2,047,567 ක් වූ ගලේ හන්දියේ සිට යෝද ඇල දක්වා රුකවුල මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ මාර්ගයේ මැද කොටස මි.මීටර් 150 ක් ඝනකමට කොන්ක්‍රීට් අතුරා නොතිබූ බව මාර්ගය ආරම්භයේ සිට මීටර් 42 ක් හා මීටර් 79 ක් දුරින් කඩා පරික්ෂා කිරීමේදී දක්නට ලැබුණි. පරික්ෂාවට ලක්කළ කොටසේ ඝනකම පිළිවෙලින් මි.මීටර් 87.5 ක් හා මි.මීටර් 100 ක් විය. වැඩ විෂයයන් 10 කින් යුත් ඉදිකිරීම් පියවරයන්ද නිසි පදිරි ඉටු කර නොතිබුණි. | නියමිත ප්‍රමිතීන්වලට අනුව ඉදි කිරීම් කරවාගත යුතුවේ. | කොන්ත්‍රාත්කරු විසින් අදාල මාර්ගය මතුපිට 5" ක ඝනකමට 1:2:4 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යෙදීමට එකඟ වී ඇති බැවින් කොන්ක්‍රීට් කොටස නිම කරන තෙක් ගෙවීම් නොකිරීමට ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට ලිපියක් මඟින් දැනුවත් කර ඇත. |
| (ආ) | පොඩි සිංඤෝ මහතාගේ නිවස අසල සිට ජයන්ත බණ්ඩා මහතාගේ නිවස අසල දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.970,818 ක් ගෙවීම් කර තිබූ අතර මාර්ගයේ ස්ථාන 12 ක් පමණ හාරා පරීක්ෂා කිරීමේදී බොරළු ඇතිරීමේ ඝනකම අඟල් 0.4 සිට 3.5 පරාසයක පැවතුණි. අඟල් 4 x 2 ප්‍රමාණයේ තිරුවානා ගල් සහිත බොරළු මාර්ගයට යොදා තිබීම නිසා නියමිත ප්‍රමිතියෙන් තොරව බොරළු අතුරා තිබුණි. | නියමිත ප්‍රමිතීන්වලට අනුව කර්මාන්ත කටයුතු කළ යුතු වේ. | වර්ෂාව හා පාරිසරික හේතූන් හේතුවෙන් සෝදා පාළුවට ලක් වී ඇත. |
| (ඇ) | මී ඔය පාලම අසල සිට රඹා වැව දක්වා මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.1,938,866 ක් ගෙවීමට අනුමත කර තිබූ නමුත් මාර්ගයේ ABC ඇතිරීම, මාර්ගය මට්ටම් කිරීම, ජලය බැස යන පරිදි සකස් කිරීම, ABC තැළීම සඳහා නියමිත බරින් යුත් රෝලක් භාවිතා කිරීම, අඟල් 1 ½ , ¾ ගල් ප්‍රමාණවත් පරිදි ඇතිරීම වැනි වැඩ කොටස් නිසි පරිදි ඉටුකර නොතිබූ අතරමාර්ගය පරීක්ෂාවේදී ABC යෙදූ ස්ථානවල ඝනකම අඟල් 2, 4, 4 ½ ආදී | නියමිත ප්‍රමිතීන්වලට අනුව ඉදි කිරීම් කරවාගත යුතුවේ. | අඩුපාඩු නිවැරදි කිරීමෙන් අනතුරුව රැඳවීම් නිදහස් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | වශයෙන් පැවතුණි. තවද මාර්ගය පුරාවට අඟල් 1 ½ ගල් මතු වී තිබීම හා එම ගල් ගැලවෙමින් මාර්ගයෙන් ඉවත් වන තත්ත්වයක් පැවතුණි. ඇස්තමේන්තු සකස් කිරීමේදී භෞතිකව මාර්ගය පරික්ෂා නොකර වෙනත් මාර්ගයක් සඳහා සකස් කර තිබූ වාර්තා භාවිතා කර තිබුණි. මේ නිසා අදාල නොවූ වැඩ විෂයන්ද ඇතුලත් කර තිබුණි. | | |
| (ඇ) | රු.1,941,123 ක් ගෙවීම් කර තිබූ මී ඔය අසල සිට රණමුක්ගම මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ මාර්ගය ආරම්භක ස්ථානය වන මාමුණුගම සිට මීටර් 9 – 17 දක්වා වූ කොටසේ මීටර් 8 x 1.2 ක ප්‍රමාණයක් ද, මීටර් 17 සිට මීටර් 49 දක්වා කොටස තුළ මීටර් 14 x 1.4 ප්‍රමාණයක් ද ගිලා බැස තිබුණි. තවද මීටර් 17 – 49 සීමාව තුළ ABC යෙදිය යුතු සනකම අඟල් 6 ක ප්‍රමාණය යොදා නොතිබූ අතර සාමාන්‍ය සනකම අඟල් 4 - 4½ දක්වා විය. මීටර් 72 – 81 දක්වා කොටස තුල මීටර් 9 x 1.9 ප්‍රමාණයක් හා මීටර් 161 සිට 164 දක්වා කොටස මීටර් 3 x 0.8 ක් පුපුරා තිබුණි. ඒ අනුව මාර්ගයේ ඉදි කිරීම් ප්‍රමිතියකින් හා සතුටුදායක ලෙස ඉටු කර නොතිබුණි. | නියමිත ප්‍රමිතීන්වලට අනුව ඉදි කිරීම් කරවා ගත යුතු වේ. | මේ පිළිබඳව කොන්ත්‍රාත්කරු දැනුවත් කිරීම සිදු කල අතර මේ වන විට එය නිවැරදි කර ඇත. රුඳවුම් නිදහස් කිරීමට පෙර නැවත පරීක්ෂා කර බලා රුඳවුම නිදහස් කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | රු.1,938,242 ක් ගෙවීම් කර තිබූමඩගල්ල ඊ.එම්.කිරිබණ්ඩා මහතාගේ නිවස අසල සිට තේක්ක වත්ත දක්වා මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ මාර්ගය ආරම්භයේ සිට මීටර් 16 – 20 අතර කොටසේ මීටර 4 x 3 ප්‍රමාණයක් ගිලා බැස තිබූ අතර ගිලා බැස තිබූ ස්ථාන කඩා පරීක්ෂා කිරීමේදී ABC යොදා නොතිබීම හා නියමිත සනකමින් යුක්තව ABC යොදා නොතිබීම දක්නට ලැබුණි. මීටර 120 – 163 දක්වා කොටසේ තාර ප්‍රමාණවත් පරිදි යොදා නොතිබීම හේතුවෙන් මාර්ගයේ මතුපිට ගල් එකිනෙක නියමිත පරිදි සම්බන්ධ වී නොතිබුණි. තවද වැඩ විෂයය අංක 15 හා 16 යටතේ කොන්ක්‍රීට් සන මීටර් 1.60ක් යෙදීම සඳහා රු.38,063 ක් ගෙවීම් කර තිබුණද එවැනි වැඩ කොටසක් ඉටුකර නොතිබුණි. | නියමිත ප්‍රමිතීන්වලට අනුව කර්මාන්ත ඉටු කරවා ගත යුතුවේ. | සිදු කරන ලද ක්ෂේත්‍රපරීක්ෂාවක් අනතුරුව කොන්ත්‍රාත්කරු දැනුවත් කිරීම සිදු කරන ලදී. ගිලා බැස තිබූ ස්ථාන නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වූ බව, රුඳවුම් නිදහස් කිරීමට පෙර පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව රුඳවුම නිදහස් කිරීමට කටයුතු කරමි. |

**3.6.2** අධිභාර

---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 මැයි 20 දින නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා වූ පාඩු යටතේ නිකුත් කළ රු.1,283,910 ක් වූ අධිභාර සහතික 04 ක් සම්බන්ධයෙන් කටයුතු අවසන් කර නොතිබුණි. | අධිභාර සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නැත. |

**04. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**අභ්‍යන්තර විගණනය**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ඇතත් 2019 වර්ෂයේ ජූලි මාසයෙන් පසුව අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. 2019 ජූලි දක්වා විගණන විමසුම් සංඛ්‍යාව 02 ක් පමණක්නිකුත් කර තිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතුශක්තිමත්ව පවත්වාගත යුතුවේ. | පිළිතුරක් ඉදිරිපත් කර නොමැත. |